# ජාතික ක්‍රීඩා අරමුදල

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට ජාතික ක්‍රීඩා අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාර්ත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම්

#### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පළමුවන දකුණු ආසියාතික වෙරළ ක්‍රීඩා උළෙල සම්බන්ධයෙන් ලැබීම් හා ගෙවීම් ගිණුමක් විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

#### 1.2.2 නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 25 (2) වගන්තිය අනුව එක් එක් ලිත් වර්ෂය ඉකුත් වූ පසු හැකිතාක් ඉක්මනින් අරමුදලේ පර්පාලනය පිළිබඳ වාර්තාවක් අමාත්‍යාංශයේ ලේකම් විසින් පිළියෙල කළ යුතු වුවත් එවැනි වාර්තාවක් පිළියෙල කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ අරමුදලේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,104,303 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය වූ රු.27,045,187 හා සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.25,940,884 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ආදායම රු.58,408,466 කින් අඩුවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ශ්‍රී ලංකාවේ ක්‍රීඩා වලට ධෛර්යයදීම, ඒවා දියුණු කිරීම හා සංවර්ධනය කිරීම අරමුදලෙ ප්‍රධාන අරමුණු වුවත් ඒ සඳහා සංයුක්ත සැලැස්මක් සහ වාර්ෂික ක්‍රියාකාර සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක

කර නොතිබුණි. ක්‍රීඩා සමාජ සහ පුද්ගලයින් විසින් ක්‍රීඩා කටයුත්තක් සඳහා කරනු ලබන ඉල්ලීමක් අනුව යම් මුදලක් ලබාදීමට පමණක් දැනට අරමුදලේ කාර්යභාරය සමාවී ඇති බව නිරීක්ෂණය විය.

3.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත කරුණු නිරීක්ෂණය කෙරේ

(අ) ගුවන් ටිකට් පත් මිළදී ගැනීම සඳහා 2011 සැප්තැම්බර් 27 දින ශ්‍රී ලංකා වූෂු සම්මේලනයට රු. 1,677,750 ක් ද 2011 සැප්තැම්බර් 29 දින ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනයට රු. 1,231,200 ක් ද ලබා දී තිබූණු අතර මෙහිදී 2008 අප්‍රේල් 24 දිනැති අංක 431 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාර ගුවන් ටිකට්පත් මිළදී ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) දැයට කිරුළ සංවර්ධන ප්‍රදර්ශනය සඳහා ක්‍රීඩා සංගම් 04 ක් සඳහා රු. මිලියනය බැගින් ලබා දී තිබුණි. එම මුදල් ලබා දීමේ දී ඒ සඳහා වියදම් ඇස්තමේන්තුවක් අදාළ සංගම්වලින් හා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලබාගෙන නොතිබුණි.

3.3 **ආර්ථික නොවූ ගණදෙනු**

වර්ෂය පුරා රු.මිලියන 03 ක සාමාන ශේෂයක් බැංකු ජංගම ගිණුමේ පැවැති අතර එය ඵලදායී ආයෝජන මාර්ගයක යෙදවිය හැකිව තිබූණු බව නිරීක්ෂණය කෙරේ.

4. **ගිණුම් කටයුතභාවය සහ යහපාලනය**

4.1 **අයවැය ලේඛනමය පාලනය**

අයවැය සහ තථ්‍ය වියදම් අතර 72% සිට 265% දක්වා විචලනයන නිරීක්ෂණය විය. එබැවින් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොතිබුණු බැවි නිරීක්ෂණය විය.

5. **පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අමාත්‍යාංශයේ ලේකම්ගේ අවධානයට වරින්වර යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ලැබීම් කුවිතාන්සි

(ආ) අයවැය

(ඇ) අරමුදල් උපයෝජනය